ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date. 2026.09.07

ආර්.ජී.සුමනදාස
අංක 17, නාමල් උයන,
පොල්වගා ජනපදය,
අම්පාර.

පැමිණිලිකාර පාර්ශවය

1. උ.පො.ප.කුමාරගේ
මූලස්ථාන පොලිස් ස්ථානය,
අම්පාර.
(වර්තමාන සේවා ස්ථානය :
පොලිස් ස්ථානය, ගොතටුව)

2. එච්.එම්.අසේල කේ. හේරත්
මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක,
මූලස්ථාන පොලිස් ස්ථානය, අම්පාර.
(වර්තමාන සේවා ස්ථානය:
මූලස්ථාන පොලිස් ස්ථානය, හලාවත)

වගඋත්තරකාර පාර්ශවය

**<u>පැමිණිලි අංකය :- HRC/AM/183/23/S/PL</u>**

**<u>පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අම්පාර ප්‍රාදේශීය කාර්යාලය වෙත 2023.09.25 දින පැමිණිල්ලක් ගොනු කරමින් පැමිණිලිකාර පාර්ශවය දන්වා සිටින්නේ තමා උප පොලිස් පරීක්ෂකවරයකු වශයෙන් අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ සේවය කළ බවත්, එසේ සේවය කරමින් සිටියදී 2018 වර්ෂයේ සිට අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය තුළ පවත්වාගෙන යන සුභසාධන වෙළඳසැලේ කළමණාකරු ලෙස කටයුතු කළ බවත් ය. උක්ත සුභසාධන වෙළඳසැල සඳහා විවිධ ආයතනවලින් භාණ්ඩ ලබාගත් බවත්, එම භාණ්ඩ සඳහා මහජන බැංකුවේ අංක 01510010001220 දරණ ජංගම ගිණුම මගින් මූලස්ථාන පොලිස් ස්ථානාධිපති හා තමා චෙක්පත් අත්සන්කර චෙක්පත් මගින් ගෙවීම් සිදුකළ බවත්, එයට අමතරව මුදලින්ද ගෙවීම් කළ බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත.

එසේම, 2022 වර්ෂයේ තමා සේවයෙන් විශ්‍රාම යාමෙන් අනතුරුව, තමා සුභසාධන වෙළඳසැලේ කළමණාකරු වශයෙන් කටයුතු කළ කාලයේ භාණ්ඩ ලබාගැනීම වෙනුවෙන් රුපියල් නව ලක්ෂ පනස් අට දහස් දෙසිය හැත්තෑදෙක (රු.958,272.00)ක මුදලක් ගෙවීමට ඇති බව දක්වා තමාට විරුද්ධව පැමිණිල්ලක්, 2023.05.27 වන දින අංක 104, ඩී.එස්.සේනානායක වීදිය, අම්පාර ලිපිනයේ පදිංචි නිල්මීර වෙළඳසැලේ හිමිකරු වන ජේ.ඒ.ජයලාල් සමන්ත යන අය විසින් අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ අංශය වෙත සිදුකර ඇති බවත්, එම පැමිණිල්ලට අදාලව 2023.09.06 වන දින තමා පොලිස් ස්ථානය වෙත කැඳවූ බවත්, තමා එදින අම්පාර පොලිස් ස්ථානය වෙත ගිය අවස්ථාවේදී පැමිණිල්ලට අදාළව තමාගෙන් කිසිදු කරුණු විමසීමක් හෝ ප්‍රකාශයක් සටහන් කරගැනීමක් සිදු නොකළ බවත්, එදිනම තමාව අත්අඩංගුවට ගෙන අම්පාර පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති උ.පො.ප.කුමාරගේ නිලධාරියා විසින් අම්පාර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 3903/23 යටතේ අසත්‍ය වැඩිදුර වාර්තාවක් මගින් ගරු අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත.

එම වැඩිදුර වාර්තාව මගින් අම්පාර මහජන බැංකුවේ ගිණුම් අංක 01510010001220 දරණ ජංගම ගිණුමට අදාළ රුපියල් ලක්ෂ හය (රු.600,000.00)ක් හා රුපියල් දෙලක්ෂ දොළොස් දහස් පන්සිය අසූ අට(රු.212,588.00)ක් වටිනා චෙක්පත් දෙකක් නිල්මීර වෙළඳසැලට ලබා නොදී තමා විසින් පරිහරණය කළ බවට අසත්‍ය කරුණු අධිකරණය වෙත වාර්තා කොට 2023.09.06 දින සිට 2023.09.12 දින දක්වා තමා බන්ධනාගාරගත කිරීමට කටයුතු කළ බවත්, එයින් තමා මානසික පීඩනයට ලක්වූ බවත්, එලෙස අත්තනෝමතික ලෙස සිරභාරයට ගැනීම තුළින් තමාගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් ප්‍රකාශ කර ඇත.

<u>වගඋතත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලේ 2 වන වගඋත්තරකරු වන අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්.අසේල කේ. හේරත් මහතා විසින් අංක 3429/23 සහ 2023.10.18 දිනැති වාර්තාව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, එහි දැක්වෙන්නේ 2023.05.27 දින නො. සී/568/01/බී, මිහිදුපුර, අම්පාර ලිපිනයේ පදිචි පී.ඒ.ජයලාල් සමන්ත යන අය විසින් පැමිණිල්ලක් සිදු කරමින් තමා නො.104, ඩී.එස්.සේනානායක වීදිය, අම්පාර ලිපිනයේ 'නිල්මීර' නමින් තොග හා සිල්ලර වෙළඳ ආයතනයක් වසර 17 ක පමණ කාලයක සිට කරගෙන යන බවත්, 2016 වර්ෂයේ සිට අම්පාර පොලිස් ස්ථානයේ ඇති සුභසාධන වෙළඳසැලට ණයට ගැනුම් මත අලෙවිය සඳහා භාණ්ඩ ලබාදීම සිදුකළ බවත්, 2018 වර්ෂයේ සිට පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැලේ කළමණාකරු ලෙස කටයුතු කළ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු වන සුමනදාස මහතාට ද පෙර ක්‍රමයටම 2022.12.10 දක්වා භාණ්ඩ ලබාදුන් බවත් ය.

එසේම, එලෙස වරින් වර ලබාගත් භාණ්ඩ සඳහා විවිධ අවස්ථාවලදී සුමනදාස මහතා විසින් මුදල් හා චෙක්පත් මගින් ගෙවීම් කළ බවත්, අවසන් වතාවට 2022.12.10 වන දින රුපියල් 704,988.00ක භාණ්ඩ රැගෙන ගිය බවත්, එලෙස රැගෙන යාමට පෙර ගන්නා ලද භාණ්ඩ වල හිඟ මුදල් වශයෙන් රුපියල් 248,234.00ක මුදලක් ගෙවීමට තිබූ බවත්, ඉන් පසුව සුමනදාස මහතා භාණ්ඩ මිලදී ගැනීමට නොපැමිණි බවත්, පසුව මේ පිළිබඳව සොයා බැලීමේ දී සුමනදාස මහතා සේවයෙන් විශ්‍රාම ගොස් ඇති බවට දැනගැනීමෙන් පසුව තමාට අයවිය යුතු රුපියල් 953,272.00ක මුදල පිළිබඳව සුමනදාස මහතාගෙන් විමසුව ද ඔහු එම මුදල නොගෙවා පැහැර හැරීමක් සිදු කරන බවත්, සුමනදාස මහතා විසින් ලබාදෙන ලද චෙක්පත් බැංකුගත කළ ද ඒවා අගරු චෙක්පත් බවට බැංකුව මගින් දැනුම් දුන් බවත් සඳහන් කරමින් ඉහත කී පී.ඒ.ජයලාල් සමන්ත යන අය විසින් පැමිණිල්ලක් කර ඇති බව 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

ඉහත පැමිණිල්ල ලද පසු එය බල අපරාධ අංක 30/2023 යටතේ ලේඛන ගත කර මෙම සිද්ධිය සම්බන්ධව අම්පාර ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත බී 3903/23 යටතේ කරුණු වාර්තා කරමින් වැඩිදුර විමර්ශනය සඳහා, මෙම අය ලබාදෙන ලද චෙක්පත් සම්බන්ධව ගරු අධිකරණය මගින් ලබාගන්නා ලද නියෝග අනුව ලබාගන්නා ලද බැංකු විස්තර වාර්තා, සටහන්කර ඇති සාක්ෂි ප්‍රකාශ මත 2023.09.06 දින සුමනදාස මහතා (ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) හට සිදු කරන ලද දැනුම් දීම අනුව ඔහු පොලිස් ස්ථානයේ පෙනී සිටීමෙන් පසු ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 386 වගන්තිය ප්‍රකාරව වරදක් සිදුවී ඇති බවට කරුණු අනාවරණය වූ බැවින් පොලිස් ස්ථානය තුළදී අත්අඩංගුවට ගෙන එදිනම ගරු අධිකරණය වෙත ඉදිරිපත් කළ බව ද 2 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත. පසුව සුමනදාස මහතා 2023.06.12 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කර 2023.06.12 දින ඇප මත මුදාහැර ඇති බව ද 2 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

1 වන වගඋත්තරකරු වන උ.පො.ප.කුමාරගේ මහතා විසින් මෙම පැමිණිල්ලට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2024.01.29 දින පැවැති පරීක්ෂණයේදී කරුණු දක්වමින් පැමිණිලිකරු අත්අඩංගුවට ගත්තේ මුදල් සම්බන්ධ වංචාව, විශ්වාසය කඩකිරීම හා සාවද්‍ය මුදල් පරිහරණය සම්බන්ධ චෝදනා තිබෙන බැවින් වන බවත්, චෙක්පත් සමබන්ධව අත්අඩංගුවට ගැනීමක් සිදුකොට නොමැති බවටත් කරුණු දක්වා ඇත.

<u>පැමිණිලිකාර පාර්ශවයේ විරෝධතා</u>

ඉහත කී 2 වන වගඋත්තරකරු වන අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්.අසේල කේ. හේරත් මහතා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද අංක 3429/23 සහ 2023.10.18 දිනැති වාර්තාව සඳහා පැමිණිලිකාර පාර්ශවය විසින් 2023.11.05 දිනැතිව විරෝධතා ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ තමා 2022.11.01 දිනට සියලු ණය ගෙවීම් අවසන්කර අදාළ චෙක්පත් දෙකම වෙළඳසැලට දී ඇති බවයි. එම චෙක්පත් දෙක තමා විසින් නිල්මිර වෙළඳසැලේ

හිමිකරු වන ජයලාල් සමන්ත යන අය හට ලබාදී නොමැති බවට ඔහු විසින් පැමිණිලි කර තිබුණද, එම චෙක්පත් අතරින් අම්පාර මහජන බැංකුවේ ගිණුම් අංක 10100012220 දරණ ජංගම ගිණුමෙන් ලබාදුන් අංක 109704 දරණ චෙක්පතේ සඳහන් රු.212,588.00ක මුදල 2022.11.30 දින ජයලාල් සමන්ත යන අයගේ බැංකු ගිණුමට බැරවී ඇති බව මහජන බැංකුවෙන් විමසා සිටීමේදී කරුණු අනාවරණය වූ බවත්, ඉහත සඳහන් ගිණුමෙන් නිකුත් කළ අංක 109703 දරණ රු.600,000.00ක් වටිනා චෙක්පත පැමිණිලිකරු විසින් උහන ජාතික ඉතිරි කිරීමේ බැංකුව මගින් එම මාසයේම වෙනත් අයෙකුගේ ගිණුමකට බැර කර ඇති බවට පෙනී යන බවත් පැමිණිලිකරු සිය විරෝධතා මගින් දක්වා ඇත.

එවැනි පසුබිමක් තුළ 2023.09.06 දින තමාව ගරු අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාවේ අම්පාර මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක 3903/2023 යටතේ ව්‍යාජ වාර්තාවක් 1 වන වගඋත්තරකාර උ.පො.ප.කුමාරගේ යන අය විසින් ඉදිරිපත් කර තමාව බන්ධනාගාරගත කළ බවත්, එමගින් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කළ බවත් පැමිණිලිකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත.

තවද, අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත නිල්මිර වෙළඳසැලේ හිමිකරු වන ජයලාල් සමන්ත යන අය සිදු කර ඇති පැමිණිල්ලට අනුව එහි වගඋත්තරකරු වන තමාව ගෙන්වා මෙම මුදල් ගෙව්වාද නොගෙව්වාද කියා විමසීමට කිසිදු විභාගයක් නොපවත්වා, තමාගෙන් ප්‍රකාශයක් ද නොගෙන, ඉහත කී චෙක්පත් දෙක සම්බන්ධයෙන් අධිකරණයෙන් නියෝග ලබා බැංකු වාර්තාවක් ද නොගෙන තමාව පොලිස් ස්ථානය වෙත කැඳවා 1 වන වගඋත්තරකාර උ.පො.ප.කුමාරගේ නිලධාරියා විසින් තමාව අත්අඩංගුවට ගෙන ව්‍යාජ වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරමින් අධිකරණය නොමග යවා තමා සිරභාරයට පත්කිරීම තුලින් තමාගේ මූලික අයිතිවාසිම් උල්ලංඝණය කිරීමක් සිදු කර ඇති බව පැමිණිලිකරු විසින් වැඩිදුරටත් දක්වා ඇත.

**<u>නිරීක්ෂණ</u>**

2023.05.27 වන දින පැය 15.50ට ඩී.එස්.සේනානායක වීදිය, අම්පාර ලිපිනයේ නිල්මිර ස්ටෝස් නමින් වෙළඳසැලක් පවත්වාගෙන යන පංගේ අප්පුහාමිලාගේ ජයලාල් සමන්ත යන අය විසින් අම්පාර පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශය වෙත මෙම පැමිණිල්ලේ පැමිණිලි පාර්ශවය වන ආර්.ජී.සුමනදාස යන අයට එරෙහිව පැමිණිල්ලක් සිදු කර ඇති බව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 57 සහ ඡේදය 244 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. එකී පැමිණිල්ල මගින් දක්වා ඇත්තේ අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ පවත්වාගෙන යන සුභසාධන වෙළඳසැල සඳහා කලක් එහි කළමණාකරු ලෙස කටයුතු කළ කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල සිදු කර ඇති පැමිණිලිකරු වන ආර්.ජී. සුමනදාස යන අය විසින් ණය පදනම මත භාණ්ඩ ලබාගත් බවත්, එසේ භාණ්ඩ ලබාගෙන 2022 ඔක්තෝම්බර් මාසය වන විට රුපියල් 958,272.00 ක මුදලක් ගෙවීමට ඉතිරිව තිබූ නමුත්, එය ගෙවීමට කටයුතු සිදුකර නොමැති බවත් ය.

උක්ත පැමිණිල්ල ලැබීමෙන් පසුව ඊට අදාළව සිදු කරන ලද විමර්ශනයේදී 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ නිලධාරියා විසින් 2023.06.17 වන දින පැය 20.00ට ඒ වන විට පොලිස් සුභසාධන වෙළඳසැල භාරව කටයුතු කළ පො.සැ.43965 කේ.ඒ. සමන් යන නිලධාරියාගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 371 සහ ඡේදය 158 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. එකී ප්‍රකාශය මගින් පො.සැ.43965 කේ.ඒ. සමන් නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ, තමා 2022.11.01 වන දින සිට අම්පාර සුභසාධක වෙළඳසැලේ පාලක ලෙස කටයුතු කරන බවත්, මෙම පැමිණිල්ලේ පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස මහතා විසින් තමා හට සුභසාධක වෙළඳසැල භාරදුන් දිනයේ එනම්, 2022.11.01 වන දින නිල්මිර වෙළඳසැල සඳහා ගෙවීමට ඇති මුදල් සඳහා චෙක්පත භාරදීමට පවසා මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගෙන් අත්සන ලබාගෙන සුභසාධක වෙළඳසැලේ මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමේ රු.600,000/ක වටිනාකමකින් යුත් අංක 109703 දරණ චෙක්පත 2022.11.12 වන දින ලෙසත්, රු.212,588/-ක වටිනාකමකින් යුත් අංක 109704 දරණ චෙක්පත 2022.12.10 වන දින ලෙසත් සඳහන් කරගැනීමෙන් පසුව රැගෙන ගිය බවත්, එලෙස රැගෙන ගිය චෙක්පත් නිල්මිර වෙළඳසැල වෙත ලබා දුන්නාද නැද්ද යන්න තමා නොදන්නා බවත් ය.

එසේම, 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ නිලධාරියා විසින් 2023.06.19 වන දින පැය 18.00ට මෙම පැමිණිල්ලේ පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය විසින් අම්පාර පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැල භාරව කටයුතු කළ සමයේ වෙළඳ සහායකයකු ලෙස කටයුතු කළ පො.සැ. 32907 සුගතපාල යන නිලධාරියාගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇති බව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 387 සහ ඡේදය 170 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. එකී ප්‍රකාශය මගින් පො.සැ. 32907 සුගතපාල නිලධාරියා විසින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය, අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැලේ කළමණාකරු වශයෙන් කටයුතු කළ කාලසීමාව පුරාවටම එහි සහයක ලෙස තමා කටයුතු කළ බවත්, පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අයට පෙර කළමණාකරු වශයෙන් කටයුතු කළ පො.සැ. 63989 සාලින්ද නිලධාරියාගේ කාලයේ සිටම නිල්මිර වෙළඳසැලෙන් ණයට භාණ්ඩ ලබාගැනීම සිදු වූ බවත්, තමා නිල්මිර වෙළඳසැලෙන් භාණ්ඩ රැගෙන ආ නමුත්, ඊට අදාළ සියලු මුදල් ගනුදෙනු සිදු කරන ලද්දේ පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය වන බවත්, පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය සුභසාධක වෙළඳසැල නැවත භාරදෙන දිනවල තමා සේවස්ථ පුහුණු පාසලේ ප්‍රජාව දැනුවත් කිරීමේ පාඨමාලාව සඳහා සහභාගී වීමට ගොස් සිටි බැවින් අවසන් ගනුදෙනු සම්බන්ධයෙන් තමා නොදන්නා බවත් ය.

ඉහත කී පො.සැ.43965 කේ.ඒ. සමන් සහ පො.සැ. 32907 සුගතපාල නිධාරීන්ගේ ප්‍රකාශ අනුව පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය විසින් නිල්මිර වෙළඳසැලෙන් ණයට ලබාගත් භාණ්ඩ සඳහා තවදුරටත් මුදල් ගෙවිය යුතුව තිබුණාද නැද්ද යන්න පිළිබඳව එකී නිලධාරීන් දැනුමවත්ව නොසිටි බව පෙනී යයි.

2 වන වගඋත්තරකාර එවකට අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්.අසේල කේ. හේරත් නිලධාරියා විසින් ඉහත කී අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 57 සහ ඡේදය 244 යටතේ සටහන් කර ඇති පංගේ අප්පුහාමිලාගේ ජයලාල් සමන්ත යන අයගේ පැමිණිල්ලට අදාළව අංක බී 3903/2023 යටතේ අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත. එහිදී අම්පාර පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැල විසින් පවත්වාගෙන යන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමට අදාළ අංක 109703 දරණ චෙක්පත (රු.600,000/-ක මුදල) සහ අංක 109704 දරණ චෙක්පත (රු.212,588/-ක මුදල) උ.පො.ප. සුමනදාස (කොමිෂන් සභාව වෙත ගොනු කර ඇති මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු) නිලධාරියා විසින් රැගෙන ගොස් නිල්මීර වෙළඳසැල වෙත ලබා දී ඇති බව පැමිණිල්ල අනුව නිරීක්ෂණය නොවන බවත්, 2022 ඔක්තොම්බර් මස චෙක්පත් දෙකකින් ගෙවීමට ඇති මුදල් ගෙවීමෙන් පසු ගෙවීම් සිදු කර නොමැති බව නිරීක්ෂණය වන බවත් 2 වන වගඋත්තරකරු විසින් බී වාර්තාවේ සඳහන් කර අධිකරණයට කරුණු වාර්තා කර ඇත.

එසේම, 2023.09.06 දින පැය 07.50ට අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 203 සහ ඡේදය 43 යටතේ යොදා ඇති සටහන අනුව 1 වන වගඋත්තරකාර උ.පො.ප.කුමාරගේ නිලධාරියාගේ දැනුම්දීම අනුව පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අය අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයට පැමිණීමෙන් පසුව රු. 953,272.00ක මුදලක් වංචා කිරීමේ චෝදනාව පහදාදී අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ. කෙසේවෙතත් මෙලෙස පැමිණිලිකරු අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විට ඔහුට එරෙහිව පැවති එකම සාක්ෂිය නිල්මීර වෙළඳසැලේ හිමිකරු වන පංගේ අප්පුහාමිලාගේ ජයලාල් සමන්ත යන අයගේ පැමිණිල්ලේ සඳහන් කරුණු පමණක් බවත්, වගඋත්තරකාර පාර්ශවය විසින් වෙනත් කිසිදු සාක්ෂියක් අනාවරණය කරගෙන නොතිබූ බවත් ඉදිරිපත්ව ඇති කරුණු අනුව පෙනී යයි.

එසේම, පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අයව 2023.09.06 වන දින අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත කැඳවනු ලැබුවද, ඔහුගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත්තේ පැය 08.10ට බව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 203 සහ ඡේදය 44 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යන අතර, අදාළ ප්‍රකාශය ලබාගෙන ඇත්තේ ඔහුව පැය 07.50ට අත්අඩංගුවට ගැනීමෙන් පසුව බව නිරීක්ෂණය වන බැවින් අත්අඩංගුවට ගැනීමට ප්‍රථම තමාගෙන් කරුණු විමසීමක් සිදු නොකළ බවට පැමිණිලිකරු විසින් සිදු කර ඇති ප්‍රකාශය පිළිගත හැකි බව පෙනී යයි. පැමිණිලිකරුගේ එකී ප්‍රකාශය අනුව ඔහු විසින් අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ පවත්වාගෙන ගිය සුභසාධක වෙළඳසැල සඳහා භාණ්ඩ ලබාගත් සෑම වෙළඳසැලක් වෙතම මුදල් ගෙවා අවසන් කර ඇති බවත්, ඔහුට එල්ල කරන චෝදනාව අසත්‍ය චෝදනාවක් බව ප්‍රකාශ කර ඇති බවත් සටහන අනුව නිරීක්ෂණය වේ.

කෙසේවෙතත් පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අයව අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති විසින් අංක බී 3903/2023 යටතේ

අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත වැඩිදුර වාර්තාවක් මගින් ඉදිරිපත් කර ඇත. එකී වාර්තාව මගින්, අම්පාර මහජන බැංකුවෙන් ලැබී ඇති වාර්තාව අනුව අම්පාර පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැල විසින් පවත්වාගෙන යන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් ඒ වන විට චෙක්පත් සඳහා අත්සන් කිරීමට හැකියාව තිබූ උ.පො.ප. සුමනදාස නිලධාරියා සහ හිටපු මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකතුමාගේ අත්සනින් යුතුව අංක 109703 දරණ චෙක්පත මගින් රු.600,000/-ක මුදලක් නිල්මිර වෙළඳසැලට භාරදීම සඳහා පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අය විසින් රැගෙන ගොස් නිල්මිර වෙළඳසැලට භාරදීමක් සිදු නොකර මෙම චෙක්පත හැටන් නැෂනල් බැංකුව මගින් මාරු කරගෙන ඇති බවට වාර්තාව අනුව නිරීක්ෂණය වන බවට අධිකරණය වෙත කරුණු දක්වා ඇත.

එහෙත් අම්පාර මහජන බැංකුව මගින් අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව පරීක්ෂා කිරීමේ දී අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැල මගින් පවත්වාගෙන යන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් නිකුත් කරන ලද රු.600,000/-ක වටිනාකමකින් යුත් අංක 109703 දරණ චෙක්පත හැටන් නැෂනල් බැංකුව, උහන මගින් තැන්පත් කර ඇති බැවින් ගිණුම්ගත වූයේ කුමන ගිණුමකට ද යන්නට අදාළ තොරතුරු ලබාගත හැකි වන්නේ අදාළ චෙක්පත රැස් කරන ලද බැංකුව මගින් බව අධිකරණය වෙත වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ. එවැනි පසුබිමක් තුළ එකී වාර්තාව මත අදාළ චෙක්පත පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අය විසින් හැටන් නැෂනල් බැංකුව මගින් මාරු කරගෙන ඇති බවට අධිකරණයට කරුණු වාර්තා කිරීම නිවරදි නොවන බව පෙනී යයි. තවද, හැටන් නැෂනල් බැංකුව, උහන මගින් 2023.11.29 දිනැති වාර්තාව අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, ඉහත කී අංක 109703 දරණ චෙක්පත මුරුතැන් රාළලාගේ මලින්ද දිසානායක යන අයගේ ඉතිරිකිරීමේ ගිණුමට බැර වී ඇති බවයි. එසේම, අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය මගින් 2023.12.19 වන දින පැය 09.50ට එකී මුරුතැන් රාළලාගේ මලින්ද දිසානායක යන අයගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඇති බව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 34 සහ ඡේදය183 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි. එහිදී තමාගෙන් මිලදී ගනු ලැබූ හාල් සඳහා තමා හට නිල්මිර වෙළඳසැලේ හිමිකරු විසින් ගෙවිය යුතුව තිබූ මුදල් සඳහා මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් නිකුත් කරන ලද රු.600,000/-ක වටිනාකමකින් යුත් අංක 109703 දරණ චෙක්පත නිල්මිර වෙළඳසැලේ හිමිකරු විසින් තමා හට ලබා දුන් බවත්, එකී චෙක්පත තමා විසින් උහන හැටන් නැෂනල් බැංකුවේ තම ගිණුමට බැර කළ බවත් මුරුතැන් රාළලාගේ මලින්ද දිසානායක යන අය ප්‍රකාශ කර ඇති බව පෙනී යයි. ඒ අනුව පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අය විසින් නිල්මිර වෙළඳසැලට ලබාදීම සඳහා රැගෙන ගොස් ඇති අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් නිකුත් කරන ලද රු.600,000/-ක වටිනාකමකින් යුත් අංක 109703 දරණ චෙක්පත නිල්මිර වෙළඳසැලේ හිමිකරු වෙත ලබා දී ඇති බවත්, එකී චෙක්පත නිල්මිර වෙළඳසැලේ හිමිකරු විසින් මුරුතැන් රාළලාගේ මලින්ද දිසානායක යන අය වෙත ලබා දී ඇති බවත් පෙනී යයි.

එසේම, පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අය විසින් නිල්මිර වෙළඳසැලට ලබාදීම සඳහා රැගෙන ගොස් ඇති අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් නිකුත් කරන ලද රු.212,588/-ක වටිනාකමකින් යුත් අංක 109704 දරණ චෙක්පත ද නිල්මිර වෙළඳසැල මගින් පිටසන් කර පිටකොටුව කොමර්ෂල් බැංකුව මගින් එම බැංකුවේ හෙන්රික් ඇන්ඩ් බ්‍රදර්ස් පුද්ගලික සමාගමේ ගිණුමට බැර කර ඇති බව අම්පාර මහජන බැංකුව මගින් අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අය විසින් නිල්මිර වෙළඳසැලට ලබාදීම සඳහා රැගෙන ගොස් ඇති අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් නිකුත් කරන ලද රු.212,588/-ක වටිනාකමකින් යුත් අංක 109704 දරණ චෙක්පත ද පැමිණිලිකරු විසින් නිල්මිර වෙළඳසැල වෙත ලබා දී ඇති බව තහවුරු වේ.

<u>නිගමනය</u>

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව අනුව නීතියෙන් නියම කර ඇති කාර්යපටිපාටිය අනුව මිස කිසිම තැනැත්තෙතකු අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතු බවට සඳහන් කර ඇත. අත්අඩංගුවට ගැනීමට අදාළ නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටිය ඇතුළත් වන්නේ 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ය. එකී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1) වගන්තිය මගින් වරෙන්තුවක් නොමැතිව පුද්ගලයින් අත්අඩංගුවට ගත හැකි අවස්ථා දක්වා ඇති අතර 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව යම් සංඥෙය වරදකට සම්බන්ධ වූ තැනැත්තකු හෝ එසේ සම්බන්ධ වූ බවට යම් තැනැත්තකුට විරුද්ධව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකුට විරුද්ධව විශ්වාස කටයුතු තොරතුරු ලැබී තිබේ ද නැතහොත් ඒ බවට යම් තැනැත්තකු සම්බන්ධයෙන් සාධාරණ සැකයක් පවතී ද එවැනි යම් තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි බව සඳහන් කර ඇත.

එසේම, <u>වලහහන්ගුනවැව ධම්මරත්න හිමි එ. සංජීව මහානාම</u> (SC FR 313/09) නඩුවේ දී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට පෙර, එම තැනැත්තාට එරෙහිව ලැබී ඇති පැමිණිල්ල සාධාරණ පැමිණිල්ලක් ද, ලැබී ඇති තොරතුර විශ්වාස කටයුතු තොරතුරක් ද, පවතින සැකය සාධරණ සැකයක් ද යන්න පොලිස් නිලධාරියා විසින් විමර්ශනයක් පවත්වා නිශ්චය කරගත යුතු බවත්, පැමිණිල්ලක් ලැබී තිබීම පමණක් අත්අඩංගුවට ගැනීමට පදනමක් නොවන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සඳහන් කර ඇත. *('A Police Officer upon receipt of a complaint or information is required to commence investigations and ascertain whether the complaint is a reasonable complaint, the information is credible or the suspicion is reasonable before proceeding to arrest a person. The fact that a complaint was made is not itself ground to arrest a person. Anyone can falsely implicate another person. A Peace Officer should be satisfied that it is a reasonable complaint.')*

මෙම පැමිණිල්ලට අනුව සලකා බැලීමේ දී පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අයට එරෙහිව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත 2023.05.27 වන දින පැමිණිල්ලක් ලැබී ඇති බව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ ග්‍රහන අපරාධ තොරතුරු සටහන් පොතේ යොදා ඇති සටහන් අනුව නිරීක්ෂණය වේ. එහෙත් ඉහත කී 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1)(ආ) වගන්තිය ප්‍රකාරව පැමිණිල්ලකට අදාළව යම් තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීමට අදාළ පැමිණිල්ල සාධාරණ පැමිණිල්ලක් විය යුතු ය. එසේම, ඉහත නඩු තීරණය මගින් ද දක්වා ඇති පරිදි එලෙස ලැබෙන පැමිණිල්ල සාධාරණ පැමිණිල්ලක් ද යන්න පොලිස් නිලධාරීන් විමර්ශනයක් පවත්වා අනාවරණය කරගත යුතු ය.

මෙම පැමිණිල්ලට අදාළව පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අයට එරෙහිව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ පැමිණිල්ල වූයේ ඔහු විසින් අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැලෙහි කළමණාකරු වශයෙන් සේවය කළ කාලසීමාවේ දී නිල්මිර වෙළඳසැලෙන් ණයට ලබාගත් භාණ්ඩ සඳහා ගෙවිය යුතු මුදල් ගෙවා අවසන් කර නොමැති බවයි. එකී පැමිණිල්ලට අදාළ විමර්ශනයේ දී එම පැමිණිල්ල ලැබෙන අවස්ථාව වන විට අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ සුභසාධක වෙළඳසැලෙහි කළමණාකරු වශයෙන් කටයුතු කළ පො.සැ.43465 සමන් සහ පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය කළමණාකරු වශයෙන් සිටියදී සහයක ලෙස කටයුතු කළ පො.සැ. 32907 සුගතපාල යන නිලධාරීන් වෙතින් ප්‍රකාශ සටහන් කරගෙන ඇත. එහිදී පො.සැ.43465 සමන් නිලධාරියා විසින් ප්‍රකාශ කර ඇත්තේ තමා සුභසාධක වෙළඳසැලෙහි කළමණාකරු ලෙස වැඩභාරගත් 2022.11.01 වන දින තමාට පෙර කළමණාකරු වශයෙන් සිටි පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය විසින් නිල්මිර වෙළඳසැලෙන් ණයට ගත් භාණ්ඩ සඳහා ගෙවීම් සිදු කිරීමට ඇති බව පවසා අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් නිකුත් කරන ලද අංක 109703 සහ අංක 109704 දරණ චෙක්පත් රැගෙන ගිය බවත්, එම චෙක්පත් නිල්මිර වෙළඳසැල වෙත ලබා දුන්නාද නැද්ද යන්න තමා නොදන්නා බවත් ය. එසේම, පො.සැ. 32907 සුගතපාල නිලධාරියා ප්‍රකාශ කර ඇත්තේ තමා සුභසාධක වෙළඳසැලෙහි සහයක ලෙස කටයුතු කළ බවත්, මුදල් ගනුදෙනු පිළිබඳව තමා නොදන්නා බවත්, ඒ සියල්ල සිදු කරන ලද්දේ පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය බවත් ය. ඒ අනුව එකී ප්‍රකාශ මගින් පැමිණිලිකරුට එරෙහිව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ පැමිණිල්ලට අදාළව එකී පැමිණිල්ලෙහි සඳහන් කරුණු සනාථ වන ආකාරයේ සාක්ෂි ලැබී නොමැති බව පෙනී යයි.

එසේම, පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අයට එරෙහිව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ පැමිණිල්ලට අදාළව අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර පැමිණිලිකාර ආර්.ජී.සුමනදාස යන අය විසින් නිල්මිර වෙළඳසැලට ලබාදීම සඳහා රැගෙන ගොස් ඇති අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය මගින් පවත්වාගෙන යනු ලබන මහජන බැංකුවේ ගිණුම් අංක 015100100012220 දරණ ගිණුමෙන් නිකුත් කරන ලද අංක 109703 සහ අංක 109704 දරණ චෙක්පත් සම්බන්ධයෙන් බැංකු වාර්තා ලබාගැනීමට අධිකරණයෙන් නියෝග ලබාගෙන ඇත. එහිදී ඉහතින්

සඳහන් කළ ආකාරයට අම්පාර මහජන බැංකුව මගින් අධිකරණය වෙත වාර්තා කරන ලද කරුණු අනුව අංක 109703 දරණ චෙක්පත උහන හැටන් නැෂනල් බැංකුවේ ගිණුමකට බැර කර ඇත්තේ කවුරුන් ද යන්න එකී උහන හැටන් නැෂනල් බැංකුවෙන් විමසීමක් සිදු කළේ නම් එකී චෙක්පත පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය විසින් නිල්මිර වෙළඳසැල වෙත ලබා දී ඇති බවත්, නිල්මිර වෙළඳසැල මගින් වෙනත් අයෙකුට ලබා දී ඇති බවත්, එකී තැනැත්තා විසින් උහන හැටන් නැෂනල් බැංකුවේ ඔහුගේ ගිණුමට බැර කර ඇති බවත් අනාවරණය කරගත හැකිව තිබූ බව පෙනී යයි.

එහෙත් එවැනි විමර්ශනයක් සිදු නොකොට 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ නිලධාරියා විසින් පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අය අත්අඩංගුවට ගෙන ඇත. එලෙස අත්අඩංගුවට ගන්නා අවස්ථාව වන විට පැමිණිලිකරු විසින් නිල්මිර වෙළඳසැලෙන් ලබාගත් භාණ්ඩ සඳහා මුදල් ගෙවා නැති බවට තහවුරු වන ආකාරයේ සාක්ෂියක් වගඋත්තරකාර පාර්ශවය වෙත ලැබී නොතිබූ බව නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිලිකාර ආර්. ජී. සුමනදාස යන අයට එරෙහිව වගඋත්තරකාර පාර්ශවය වෙත ලැබී තිබූ පැමිණිල්ල, සාධාරණ පැමිණිල්ලක් බවට අනාවරණය වී නොමැති අවස්ථාවකදී පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන ඇති බැවින් එකී අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කර ඇති කාර්යපටිපාටිය වන 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 32(1)(ආ) වගන්තියට අනුකූල නොවන බව සනාථ වේ.

ඒ අනුව එලෙස නීතියෙන් නියම කරන ලද කාර්යපටිපාටියට පරිබාහිරව අත්තනෝමතික අයුරින් පැමිණිලිකාර ආර්. ජී. සුමනදාස යන අය අත්අඩංගුවට ගෙන ඇති බව තහවුරු වන බැවින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති නීතියෙන් නියම කර ඇති කාර්යපටිපාටිය අනුව මිස කිසිම තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතුය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ නිලධාරියා විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, පැමිණිලිකාර ආර්. ජී. සුමනදාස යන අය 2023.09.06 වන දින පැය 07.50ට අත්අඩංගුවට ගෙන ඇති අතර, එකී අත්අඩංගුවට ගැනීම නීතියෙන් නියම කරන ලද කාර්යපටිපාටියට පරිබාහිරව අත්තනෝමතික අයුරින් සිදු කර ඇති බවට ඉහත කරුණු අනුව තහවුරු වී ඇත. කෙසේවෙතත් පැමිණිලිකාර ආර්. ජී. සුමනදාස යන අය අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ නිලධාරියා විසින් පැමිණිලිකරුව සිර මැදිරියේ රඳවා තැබීම සඳහා උපසේවක පො.සැ. 34532 සරත් නිලධාරියාට භාර දී ඇති බව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ ග්‍රහන අපාරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 203 සහ ඡේදය 43 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව එදින එනම්, 2023.09.06 වන දින පැය 07.55ට උපසේවක පො.සැ. 34532 සරත් නිලධාරියා විසින් පැමිණිලිකාර ආර්. ජී. සුමනදාස යන අය සිර මැදිරියට යොමු කර ඇති බවත්, එදිනම පැය 09.10ට අම්පාර මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා රැගෙන ගොස් ඇති බවත් අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ ග්‍රහන අපාරාධ තොරතුරු සටහන් පොතේ පිළිවෙළින් පිටුව 203, ඡේදය 43 සහ පිටුව 206, ඡේදය 47 යටතේ යොදා ඇති සටහන් අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව එලෙස සාධාරණ

හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයේ රැඳවා තැබීමට නියෝග කිරීම මගින් 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ නිලධාරියා විසින් පැමිණිලිකාර ආර්. ජී. සුමනදාස යන අයගේ පෞද්ගලික නිදහස අහිමි කර ඇති බව තහවුරු වේ. එසේහෙයින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(2) ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති යම් තැනැත්තෙකු අත්තනෝමතික අයුරින් අත්අඩංගුවෙහි තබාගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම නොකළ යුත්තේ ය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම ද 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ නිලධාරියා විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් **<u>මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා</u>** එදිරිව **<u>පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය</u>** **(SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඉහතින් දක්වා ඇති පරිදි 1 වන වගඋත්තරකරු විසින් දෝෂ සහගත ලෙස පැමිණිලිකරු අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත කැඳවා අත්අඩංගුවටගෙන ඇති බැවින්, 2 වන වගඋත්තරකාර එවකට අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්. අසේල කේ. හේරත් නිලධාරියා විසින් සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනීයයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 2 වන වගඋත්තරකරු විසින් ඔහුගේ අධීක්ෂණ වගකීම යටතේ ක්‍රියාකර ඇති ආකාරය අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම 2 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටී.**

1. 1 වන වගඋත්තරකාර උ.පො.ප. කුමාරගේ සහ 2 වන වගඋත්තරකාර එවකට අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්. අසේල කේ. හේරත් යන වගඋත්තරකාර නිලධාරීන් විසින් එක් අයෙකුගෙන් රුපියල් පනස්දහස (රු.50,000/-)ක මුදලක් බැගින් රුපියල් එක්ලක්ෂය (රු.100,000/-)ක මුදලක් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

2. 1 වන සහ 2 වන වගඋත්තරකරුවන් මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

3. පැමිණිලිකාර ආර්.ජී. සුමනදාස යන අයට එරෙහිව අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානය වෙත 2023.05.27 වන දින පංගේ අප්පුහාමිලාගේ ජයලාල් සමන්ත යන අය විසින් සිදු කර තිබූ පැමිණිල්ලෙහි සත්‍යාසත්‍යතාවය පිළිබඳව විමර්ශනය කර පංගේ අප්පුහාමිලාගේ ජයලාල් සමන්ත යන අය සම්බන්ධයෙන් සුදුසු නීතිමය පියවර ගැනීමට අම්පාර මූලස්ථාන පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

2026. 10 . 30 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් සහ පොලිස්පතිවරයා වෙත දන්වමු.

එසේම, 1 වන නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :- 01. අමාත්‍යතුමා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල. - කරුණු දැනගැනීම සඳහා

02. පොලිස්පති
ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

03. මූලස්ථාන පොලිස් පරීක්ෂක
මූලස්ථාන පොලිස් ස්ථානය,
අම්පාර. - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.